චක්‍රලේඛ අංක:- 1/2001(1)

මගේ අංකය: බප/සසේකො/ලේ/තිරි/2001
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07.
2001.09.20

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

## බස්නාහිර පළාතේ සමුපකාර සේවක වැටුප් ප්‍රතිශෝධනය – 2001

අංක 2/96 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛය මගින් බස්නාහිර පළාතේ සමුපකාර සේවකයන් සඳහා අනුමත කර තිබූ වැටුප් ක්‍රමය 1/2001 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛය මගින් සංශෝධනය කර තිබේ. මේ අනුව සේවකයන් ලබමින් සිටි පැරණි වැටුප නව වැටුපට පරිවර්තනය කිරීමේදී කටයුතු කළයුතු ආකාරය 1/2001 දරණ චක්‍රලේඛයේ 03 වැනි ඡේදයෙන් පැහැදිලි කර තිබේ. එසේම පැරණි වැටුප නව වැටුපට පරිවර්තනය කිරීමේදී පියවරෙන් පියවර කඩා වැටුප් පරිවර්තනය කිරීම අනුමත නොකරන බව 1/2001 චක්‍රලේඛයේ 05 වන ඡේදයෙන් පැහැදිලි කර තිබේ. නමුත් ඇතැම් සමුපකාර සමිති 2001.06.27 වන දින අංක 1/2001 දරණ චක්‍රලේඛය පැහැදිලි කරමින් ම විසින් එවන ලද ලිපියට අමුණා තිබූ වැටුප් චක්‍රය පදනම් කර ගෙන පියවරෙන් පියවර සිටින පරිදි සේවක වැටුප් පරිවර්තනය කරනු ලබන බවට මා වෙත පැමිණිලි ලැබී තිබේ. එසේ පියවරෙන් පියවර වැටුප් පරිවර්තනය කිරීම නිවැරදි නොවේ. එනිසා කිසියම් සමිතියක් වැරදීමකින් එසේ කර ඇත්නම් වහාම එය නිවැරදි කරන ලෙස කොමිෂන් සභාවේ නියමය පරිදි දැන්වීමට කැමැත්තෙමි.

ජේ.එස්. විමලවීර,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමුපකාර, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ නිලධාරී
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, සමුපකාර, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් වරුන්
8. සියලුම වෘත්තීය සමිති සංගම්